## 261 සාමයෙ මිහිර බෙදා

සාමයෙ මිහිර බෙදා දෙන්නට ලෝකෙ පුරා
සමිඳුනි මා ඔබගේ දෑතේ ආයුධයක් වේවා

වෛරය අසමගි තැන් සොයලා ප්‍රේමය සමගිය එහි යොදලා
විශ්වාසය මද තැන් සොයලා බලාපොරොත්තුව ඇති කරමු

ශෝකය ඇති තැන සැනසුම ලා අඳුරු තැනට ආලෝකය ලා
සොවින් පිරුණු තැන් මකා දමා සොම්නස එහි අපි ඇති කරමු

සැනසුම අප පතනවට වඩා අනුන්ව නිතරම සනසවලා
තේරුම් ගනු ලබනවට වඩා තේරුම් ගනිමින් දිවි ගෙවමු

සැම අය හට අප බෙදන ලෙසේ අපට ද එලෙසම ලැබෙනවනේ
මරණින් මතු අප ජීවිතයේ අප දිවි ගෙවනෙමු ලකුණක් සේ